"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත

## ஆளுநர் செயலகம் - தென் மாகாணம்

## Governor's Secretariat - Southern Province

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number | G/SP/1/1/2/2024 | ඔබේ අංකය / உமது இல. / Your Number | | දිනය / திகதி / Date | 2024.01.19 |

23 JAN 2024

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම (2024 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා ජීවන වියදම් දීමනාව සංශෝධනය කිරීම)</u>**

උක්ත ශීර්ෂයෙන් යුතුව මා අමතන ලද ඔබේ අංක CSS/7/13/1 හා 2024.01.19 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින් ඉදිරිපත් කර ඇති, භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2024.01.12 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 දරන චක්‍රලේඛය දකුණු පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරි/ ආයතන සඳහා අදාළ කර ගැනීමට **2024.01.19** දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

03. එසේ වුව ද උක්ත සංශෝධනයට අදාළ ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම පළාත් භාණ්ඩාගාරය සතු වගකීමක් බව ගරු ආණ්ඩුකාතුමා විසින් අවධාරණය කරන ලදි.

04. අනුමත චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

දීපිකා කේ. ගුණරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: DMS/General/CM/2024-01

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2024.01.12

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**2024 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා ජීවන වියදම් දීමනාව සංශෝධනය කිරීම**

රජය විසින් ප්‍රකාශිත 2024 අයවැය යෝජනා අනුව ජීවන වියදම් දීමනාව ගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය.

02. ඒ අනුව පහත සඳහන් (i, ii හා iii) කාණ්ඩයන්ට ඇතුළත් නොවන, සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මගින් ආවරණය වන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය මෙම ගෙවීම සඳහා හිමිකම් ලබයි.

- i. සාමූහික ගිවිසුම් මගින් හෝ ඒ ආකාරයේ අවබෝධයකින් වැටුප් තීරණය කරනු ලබන ආයතන
- ii. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කොටගත් විචල්‍ය ජීවනාධාර දීමනාවක් මාසිකව ගෙවනු ලබන ආයතන
- iii. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 මගින් කාර්ය මණ්ඩල හා අදාල වැටුප් තීරණය කරනු නොලබන ආයතන හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 යටතේ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.1(i) යටතේ දක්වා ඇති ඇමුණුම A යටතේ හඳුනාගෙන ඇති ආයතන

03. **ජීවන වියදම් දීමනාව**

ඉහත අංක 02 හි පරිදි දැනට එම දීමනාව සඳහා සුදුසුකම් ලබන, හිමිකම් සහිත කාර්ය මණ්ඩලය සඳහා

- i. 2024 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය තෙක් මාසික ජීවන වියදම් දීමනාව ගෙවීමේ දී මසකට ගෙවනු ලබන රු. 7,800/= ක ජීවන වියදම් දීමනාවට, 2024 අයවැය යෝජනා අනුව වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව වන රු. 10,000/- ක ජීවන වියදම් දීමනාවෙන් 50% ක් වන රු. 5,000/- ක් එකතු කර රු. 12,800/- ක් ගෙවීම.
- ii. 2024 අප්‍රේල් මාසයේ සිට මාසික ජීවන වියදම් දීමනාව ගෙවීමේ දී රු. 12,800/= ජීවන වියදම් දීමනාවට, 2024 අයවැය යෝජනා අනුව ලබා දිය යුතු රු. 10,000 න් ඉතිරි 50% වන රු. 5,000/- එකතු කර රු. 17,800/-ක් ගෙවීම.
- iii. 2024 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය තෙක් වූ හිඟ ජීවන වියදම් දීමනාව 2025 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය තෙක් මාසිකව රු. 5,000/- බැගින් ගෙවා අවසන් කිරීම.

iv. තවද, 2024.01.01 දින හෝ එයින් පසු විශ්‍රාම යන/ විධිමත් ලෙස සේවයෙන් ඉවත් වන/ මිය යන නිලධරයන් හට ඔවුන් විශ්‍රාම ගන්නා දිනය/ විධිමත් ලෙස සේවයෙන් ඉවත් වන දිනය/ මිය යන දිනය තෙක් හිමි විය යුතු 2024 අයවැය යෝජනා අනුව වැඩිකළ සම්පූර්ණ ජීවන වියදම් දීමනාවෙන් ගෙවා නොමැති හිඟ මුදලක් ඇත්නම් එම හිඟ මුදල ඔවුන්ගේ අවසන් මාසික වැටුප සමඟ ගෙවීම.

04. **අනියම් / දෛනික වේතන මත සේවය කරන සේවකයින්ට දීමනා**

අනියම් / දෛනික වැටුප්ලාභී පදනම මත සේවය කරන සේවකයින්ට 2014.01.06 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2014හි 04 ඡේදය යටතේ දැනට ගෙවනු ලබන රු. 260/-ක දෛනික ජීවන වියදම් දීමනාවට අමතරව ඉහත 3හි i, ii හා iii යටතේ වන වැඩි කරන ලද ජීවන වියදම් දීමනාවේ අගය, අනියම් / දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා එක් එක් මාසයේ සේවය කර ඇති එක් දිනකට 1/30 පදනම මත ගණනය කර ඉහත i, ii හා iii අනුව මසකට හිමි මුදල නොඉක්මවන පරිදි එහි සඳහන් විධිවිධානයන්ට යටත්ව ගෙවීම.

05. **සාවද්‍ය ගණනය කිරීම්**

මෙම චක්‍රලේඛයෙන් පරිබාහිරව කිසියම් තැනැත්තෙකුට මොනයම් හෝ වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් ඒ පිළිබඳ ආයතනයේ මූලා කළමනාකරු/ගණකාධිකාරී පෞද්ගලිකව වගකිව යුතු අතර, ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී. එවැනි සාවද්‍ය වැටුප් පරිවර්තනයන් හෝ ගෙවීම් සිදුකරන වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට අදාළ බලධාරීන් ක්‍රියා කළ යුතු වේ.

කේ.එම්.මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
4. විගණකාධිපති
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව